




**සහන් වීරසේකර**

මතක පොතේ හැටියට ලාංකීය ඉතිහාසයේ ප්‍රථම පළාත් සභා පැවති කාලයයි. රටේ දස අත කලබල ස්වරූපයක්. කකුලේ වේදනාව උහුලනු බැරියා. බුද්දක, ගල් තැල්මක මහත, වේදනාව, උඩු දුව ඇති හැඩක්. ගුණදාස අයියාගේ මයිනර් කැපුවත් නිල් කියලා ලොකු අම්මා කියන්නේ. එතකොට ලොකු අම්මලා කොළ වගේ මට හැගෙන්නේ. ටයි පටියක් ද සමගින් සම්පූර්ණ යුරෝපීය ඇඳුම් කට්ටලයකින් සාමාන්‍ය වශයෙන් සැරසී සිටි දොස්තර අන්තෝනිස්ගේ කාමරය පුරාම රසායන දියරින් පුරවා තිබූ

කරේ තියෙනවාමයි. අපේ තාත්තා නම් ඇන්දේ සරමයි , ලොකු සෙරෙප්පු දෙකකුයි විතරයි. හැබැයි ගමනක් යනකොට පනාව නම් කොණ්ඩේ ගහ ගන්නවාමයි. එතකොට සුදු කෝට් එකකුත් දාගන්නවා. ගෑණු අය හැමෝම ඇන්දේ සුදු පාට හැට්ට. සාය නම් එක එක පාටින් ඇන්දා. අපේ ඉස්කෝලේ ඇඳුමට නිල ඇඳුමක් කියලා දෙයක් තිබුණේ නැහැ. හැබැයි අපි හැමෝම තොප්පි දාගෙනයි ඉස්කෝලේ ගියේ. ගාල්ලේ අය රේන්ද ඇන්දෙත් මේ කාලේ.

එදා මුලු කොළඹම හුගාක් පාලුයි. ගෙවල් තිබුණේ හරිම අඩුවෙන්. ගාලු පාර හරිම පටුයි. ඇත්තටම කියනවා නම් ගාලු පාර විදියට තිබුණේ ගුරු පාරක්. ගාලු පාරට තාර දාපු දවසත් මට තාම මතකයි. දොස්තර හිනාවේ. ඒ කාලයේ වැඩියෙන් ම තිබුණේ අශ්ව කරත්ත, බර කරත්ත, බක්කි කරත්ත තමයි. මෝටර් සයිකල් කිහිපයකුත් තිබුණා. ඒත් ඒවාට සයිලන්සර් තිබුණේ නැහැ. මේ හින්දා වැල්ලවත්තේ ඉදන් මෝටර් සයිකලයක් එනකොට කොල්ලුපිටියට ම ඇහෙනවා. ඒ




නිකලස් පියතුමා ගෝරනාඩුවක් දැම්මා. කොහොම හරි මම ඉංගිරිසි ඉගෙන ගෙන පස් වැනි කැලෑසියේ ඉදන් ඉංගිරිසි තෑග්ගත් දිනුවා. හැව්ලොක් පාරට යනකල් ම එකම ගෙයක්වත් දකින්න තිබුණේ නැහැ. එක දිගට ම රබර් යාය. රබර් වත්ත මැද්දෙන් අඩි පාරක් තිබුණා.

එදා කොළඹ ගෙවල්වල නාන කාමර, වැසිකිළි එහෙම තිබුණේ නැහැ. බුද්දකගේ මුහුණේ සිනාමලක් පිපෙයි. කොළඹ කවුරුත් නාන්න ගියේ " බාල්දි වත්ත" ට. ඒක තිබුණේ දැන් මල්ලිකා නිවාසය තියෙන වත්තට අල්ලපු වත්තේ. අපි බම්බලපිටියේ ඉදන් පයින් ම එතැනට යනවා. පාර වැටිලා තිබුණේ වතු මැද්දෙන්. ගෙවල් අඩු නිසා හැමෝම අඳුනනවා. මේ නිසා නාන්න යනකොට හම්බු වෙන හැම ගෙයක් ම "කෑම ටිකක් කන්න එන්න" කියලා අපිට කතා කරලා

## අත තිබ්බත් සනීප වෙන - සැත්කම් විස්කම් කළ මව්බිමේ නම රැන්දූ දොස්තර දෙව්යා

# දොස්තර පී. ආර්. අන්තෝනිස්

ටැක්සියේ ඔන්න යනවා බුද්දක පටවා ගෙන. පුරහල රවුම පසුකර විහාරමහා දේවි උද්‍යානය අසල ඇති අපූර්ව ගෘහය.

"සිස්ටර් අදම මෙයා කලීල් එකට ඇඩ්මිට් කරන්න." සිස්ටර් කියා දොස්තර ඇමතුවේ බුද්දකගේ ලොකු අම්මාට විය. නෑකම මෙන්ම සේවා ගරුත්වය ඇය නිබඳව රැකි බව මගේ කුඩා මොළේට වැටහේ.

"අපි පුතාට බෝධි පූජාවක් වත් කරමු", අම්මා යෝජනා කරයි.

"බෝධි පූජා ගැන කිවුවම මතක් වෙන්නේ පානදුරේ අරියධම්ම හාමුදුරුවෝ." දොස්තර අන්තෝනිස් තමන් ප්‍රතිකාර කල ඒ උතුම් හාමුදුරුවන් වහන්සේ සිහිපත් කරයි. " හාමුදුරුවන්ට වස දුන්නාලු නේද?" ඩොක්ටර්, අහක හිටිය ගුණදාස මාමාත් හොට දැම්මා.

"හාමුදුරුවන්ට සෙම අමාරුව තිබුණා. හාමුදුරුවන්ට පපුවේ අමාරුව දෙවරක් හැදුනා. කවුරුත් හාමුදුරුවන්ට වස දුන්නේ නැහැ,"දොස්තර අන්තෝනිස් හෙමින් කියයි.
බොහොමයක් අතීත මතක සටහන් හරිම සුන්දරයි. අපට රසවත් තේ කෝප්පයක්.

ගෙවී ගිය සියවස ආරම්භයේ දී ඒ කියන්නේ 1911 වසරේ දී උපත ලැබූ මේ විශිෂ්ට මිනිසා තමන්ගේ 90 වැනි උපන් දිනයට මාසයක් තිබිය දී සිය ජීවිතයෙන් සමුගත්තා. ලංකාවේ සිටි අංක එකේ ශල්‍ය වෛද්‍යවරයෙක් වූ ඔහු ලංකාවේ ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ ආරම්භක විදුහල්පතිවරයා ද වුණා.

හිටපු අගමැති එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාට වෙඩි වැදීමෙන් පසු කළ අවසන් ශල්‍ය කර්මයට සහභාගි වූයේත් දොස්තර අන්තෝනිස් කියලා තමයි බුද්දකගේ තාත්තා කියන්නේ. අපේ තාත්තා



බෝතල්වල මිනිස් අවයව රාශියක් දකින්නට තිබුණු ආකාරය බුද්දකට හොදට මතකයි. මට ආ ගිය තොරතුරු වාර අනන්තයි.

බුද්දක ගෙදර එල්ලා ඇති පින්තූරයක් පෙන්වයි. අපේ දොස්තර කියයි. ඔය රජ පවුලේ පිංතූරයක්. මම ඉපදුණේ සිස්ටර් බම්බලපිටියේ. අපේ ගෙදර ඇතුළේ බුදුහාමුදුරුවන්ගේ රූපයක් රාමු කරලා එල්ලලා තිබුණා. විශ්වාස කරන්න ඒත් ගෙදර ඉස්සරහ එංගලන්ත රජ පවුලේ රූපයකුයි, සාර් රජ පවුලේ රූපයකුයි රාමු කරලා තිබුණා. රජ පවුලේ පිංතූරයක් එදා හැම ගෙදරකම වගේ තිබුණා. බුද්දකට මෑතක සිටි රජා ද නුවර පෙරහැරේ රාජා ද මතක් වේ.

එදා කොළඹ හිටිය පිරිමි හැමෝම වගේ ඇන්දේ පට සරම. එහෙම නැතිනම් පලේකාට් සරම. බැනියමකුත් ඇන්දා. ලේන්සුවක් නම්

සද්දේ ඇහෙන කොට අපි පාරට දුවගෙන ඇවිත් ඒක යනකම් බලාගෙන ඉන්නවා. අපි ඉස්කෝලේ ගියේ රික්ෂෝවල.

මම කලින්ම ඉගෙන ගන්න ගියේ බම්බලපිටියේ වජිරාරාමයට. පැලෑණේ ශ්‍රී වජිරඥාන හාමුදුරුවෝ තමයි පන්සලේ වැලි මලුවේ අ යන්න ලියන්න මට මුලින්ම කියලා දුන්නේ. මම මුලින්ම ගිය ඉස්කෝලේ තමයි ශාන්ත පීතර විදුහල, අපිව ඉස්කෝලයට භාර ගත්තේ ගෙදරදීවත් සිංහලෙන් කතා කරන්නේ නැහැ කියන පොරොන්දුව උඩයි. එතකොට මට ඉංග්‍රීසි බැහැ. ඒ කාලයේ බම්බලපිටියේ වජිර පාරේ ඉදන් එක දිගට ම තිබුණෙ රතු පාට බොරලු තිබ්බ පටු පාරක්. විශාඛා විද්‍යාලය ඒ වෙනකොට තිබුණේ නැහැ. එතැන තිබුණේ ලොකු කැලෑවක්. භාර මාසයක් ඇතුළත ඉංගිරිසි ඉගෙන ගත්තේ නැතිනම් ඉස්කෝලයෙන් අස් කරනවා කියලා

කෑම බීම නොදී මිසක් යන්න දෙන්නේ නැහැ. බාල්දි වත්තේ ලොකු ළිදක් තිබුණා. ගැහැණු පිරිමි වෙන වෙනම කොටස් දෙකක එතැන නෑවා.අපූරු නෑමක් යයි බුද්දකට සිතෙයි, හැබැයි මේ කාලේ බාල්දියෙන් නාන එවුන්ට වඩා බාල්දි පෙරලන එවුන් බොහොමයි.

ගෙවල්වල වැසිකිළි තිබුණේ නැති නිසා සේරම ගෙවල්වල අය වතුර අරගෙන එක වත්තක තිබුණු බාල්දි වැසිකිළිවලට යනවා. ගැහැණු පිරිමි දෙගොල්ලන්ට වෙන වෙනම බාල්දි තිබුණා. මහ රෑට එන මනුස්සයෙක් ඒ බාල්දි සෝදනවා. අපේ ආච්චිගේ පිස් පෝච්චිය මතක් උනා. ගඳ පිළිබඳ අවබෝධයට වඩා කකුලේ කකුලේ වේදනාව බුද්දකට දැනේ.
"මාව සිහි නැති කරනවා ද ඩොක්ටර්.?" දොස්තර අන්තෝනිස් කනාටු හිනාවක් පා " මට සිස්ටර් කියලා තියෙනවා ඔයා ගැන. ගෙදර සින්දු කියන එකමලු වැඩේ." බුද්දකගේ ලැජ්ජාව එලියට පනි, වේදනාව කොහේදෝ සිරවෙයි.

චාල්ස් මහත්තයාගේ ගේ තමයි ලොකුම ගෙදර. කොළඹ කොහේවත් එදා තට්ටු ගෙවල් තිබුණේ නැහැ. කටුගේ තමයි තිබුණු ලොකුම ගොඩනැගිල්ල. උසම ගොඩනැගිලි නම් තිබුණේ කොටුවේ චැතැම් වීදියේ ඔරලෝසු කණුව ළගයි. "බවුස්ටඩ්" සමාගමේ බස් තුනක් විතර පාරේ දිවුවා. ශ්‍රීමත් චාල්ස් හෙන්රි ද සොයිසා උන්නැහේට තමයි චාල්ස් මහත්තයා කිවුවේ. බුලර්ස් පාරේ ඉදන් මහ පාරට එන්නත් එදා පාරක් තිබුණේ නැහැ. බගතලේ පාරට යනකල් ම සම්පූර්ණයෙන් ම තිබුණේ ලොකු වත්තක්. ඒ වත්ත අයිති වෙලා තිබුණේ චාල්ස් මහත්තයාට. ඒ වෙනකොට දෙහිවල සත්තු වත්ත හදලා තිබුණේත් නැහැ. චාල්ස් මහත්තයාගේ වත්තේ පුංචි සත්තු වත්තක් තිබුණා. ගෝන්නු , මුවෝ වගේ සත්තු ඒකේ හිටියා. හොඳ වෙලාවට වනජීවී ඇමතියෙක් ඉදලා නෑ. එක්කෝ මුවා මස් කරනවා නැත්නම් පුංචි සත්තු වත්ත පස් කරනවා. බුද්දකගේ

41 වන පිටට